රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 37/94

මගේ අංකය : I /543ඊ/832ඩී(1),
රාජ්‍ය පරිපාලන, පාර්ලිමේන්තු කටයුතු හා
වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
1994 ඔක්තෝබර් මස 21 වන දින.

සියලුම ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

<u>වයස 60 ඉක්මවූ නිලධාරීන්.</u>

සංස්ථා සහ මණ්ඩල ඇතුළුව රාජ්‍ය සේවයේ සන්නද්ධ හමුදාවල සහ පොලිස් දෙපාර්තමේන්තුවේ තනතුරු දරනු ලබන වයස අවුරුදු 60 ඉක්මවූ පුද්ගලයන්ගේ රැකියා කොන්ත්‍රාත්තු අවසන් කළ යුතුයයි අමාත්‍ය මණ්ඩලය විසින් 1994.08.31 දින තීරණය කර ඇත. මේ සම්බන්ධයෙන් පහත සඳහන් තීරණ ද රජය විසින් 1994.09.28 දින ගෙන ඇත.

(අ) මෙම තීරණය ක්‍රියාත්මක කරණු ලබන බවට එක් එක් අමාත්‍යාංශය විසින් වගබලා ගත යුතුය.

(ආ) කිසියම් පුද්ගලයෙකුගේ වත්මන් කොන්ත්‍රාත් කාල සීමාව අවසන් වන තෙක් ඔහු සේවයේ රඳවා ගනු ලැබිය හැකිය.

(ඇ) ඉහත දක්වන ලද සාමාන්‍ය රීතියෙන් බැහැර වීමක් වෙතොත් ඒ සඳහා නිශ්චිත අමාත්‍ය මණ්ඩල අනුමැතිය අවශ්‍යය.

02. මේ අනුව කටයුතු කිරීමට කරුණාකර සටහන් කර ගන්න.

අ.කලේ/(ආර්.එස්.ජයරත්න)
ලේකම්, රාජ්‍ය පරිපාලන, පාර්ලිමේන්තු කටයුතු හා
වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය.